
**සවියෙන් පෙරට අපි එකට**

**e- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**



| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | පුරවැසි අධ්‍යාපනය | 2 | 02. අපේ ජන සමාජය |


**සැකසුම: ගයානි විජේමාන්න**


**බප/හො/ගල්පාත ක.වි**

ජන සමාජයක් යනු

මිනිසා මුල්කරගත්,
මිනිසා විසින්
නිර්මාණය කර
ගත්තකි

# මිනිසා පසු කළ විවිධ යුග දෙස බැලීමේදී මිනිස් සමාජය සරල මට්ටමේ සිට සංකීර්ණ ස්වභාවයකට පත් වී ඇත











# ජන සමාජය තුළ ඇති අන්තර් සම්බන්ධතා

## සබඳතාවල පදනම ආරම්භ වන්නේ පවුල මුල් කරගෙනය



# දෙමාපිය දූ දරු අන්තර් සබඳතා

- සමාජයේ පැවැත්මට අවශ්‍ය පුද්ගලයින් බිහි කරන ප්‍රධාන මූලය පවුලයි

| දෙමාපියන් දරුවන් සමග | දරුවන් දෙමාපියන් කෙරෙහි |
|---|---|
| දරුවන් පෝෂණය | වියපත් වූ විට රැක ගැනීම |
| ආරක්ෂා කිරීම | පෝෂණය කිරීම |
| අධ්‍යාපනය ලබා දීම | ආදරය කිරීම |
| අනෙකුත් අවශ්‍යතා සදහා සහය වීම | අවනත වීම |
| ලෙඩ රෝගවලින් ආරක්ෂා කිරීම | **අනෙකුත් අවශ්‍යතා සදහා සහය වීම** |
| සුදුසු කල්හී අවාහ විවාහ කර දීම | **සහය වීම** |

# ගුරුවරුන් සහ සිසුන් අතර අන්තර් සම්බන්ධතා පවත්වා ගන්නා අවස්ථා

- දරුවා මැනවින් හික්මවීම
- දරුවාගේ හැකියා, දක්ෂතා, විභවතා මැනවින් හඳුනා අවශ්‍ය මග පෙන්වීම් කිරීම
- අධ්‍යාපනය ලබා දීම
- යහගුණ කියා දීම
- වැරදි නිවැරදිකර පෙන්වමින් සමබර පෞරුෂයක් ගොඩ නැගීම

# අසල්වැසියන් සමග අන්තර් සම්බන්ධතා

- **ජන සමාජයක පවුල මගින් අන්තර් සම්බන්ධතා පවත්වන ආසන්නතමයා අසල්වාසීන්ය.**
- **අසල්වාසීන් සමග පවත්වා ගෙන යන මානුෂීය ගුණ ධර්ම**

✓ *සමගිය*

✓ *සහෝදරත්වය*

✓ *සහයෝගය*

✓ *උදවු කිරීම*

✓ *බෙදා හදා ගැනීම*





ගුරුවරුන් දරුවන් හා අන්තර් සම්බන්ධතා



අසල්වැසියන් සමග අන්තර් සම්බන්ධතා



දෙමාපිය දූ දරු අන්තර සම්බන්ධතා

# සමාජයේ ඇති ආයතන සමග අන්තර් සම්බන්ධතා පැවැත්වීම



# ජන සමාජය තුළ පවත්නා විවිධ සම්බන්ධතා

ආගමික සංවිධාන → දායක වේ

ග්‍රාම සංවර්ධන සමිති → සහායවේ

ක්‍රීඩා සංවිධාන → දායක වේ

| ආගම ඉගැනීමට | ග්‍රාමය සංවර්ධනයට | විනය හා ශික්ෂණයට |
|---|---|---|
| අධ්‍යාත්මික සංවර්ධනයට | සහයෝගයෙන් කටයුතු කිරීමට | ක්‍රීඩා කටයුතු දියුණුවට |
| සාරධර්ම හුරු කිරීමට | ගමට නායකත්වය සැපයීමට | ජය පරාජය හුරු කිරීමට |
| ආගමික වතාවත්වලට | ප්‍රදේශයේ ආරක්ෂාවට | නායකයින් තැනීමට |
| පොදු කටයුතුවලට | සුභ සාධන කටයුතුවලට | සහයෝගයෙන් කටයුතු කිරීමට |
| සමාජය විනයවත් කිරීමට | පොදු සේවා සැපයීමට | සංවිධාන ශක්තිය දියුණුවට |

# දත්ත හා තොරතුරු ජන සමාජයේ යහ පැවැත්ම පිණිස යොදා ගැනීම

දත්ත යනු

කිසියම් විෂය ක්ෂේත්‍රයක්

හා

සම්බන්ධව

තොරතුරු ඉදිරිපත් කරන

මූලාශ්‍රයි

# තොරතුරු ලබා ගැනීමට ඇති ප්‍රවේශ මාර්ග





















# දෛනිකව ඉදිරිපත් කෙරෙන අපට අත්‍යවශ්‍ය වන තොරතුරු

- කාලගුණ අනාවැකි
- විනිමය අනුපාත
- වෙළඳ පොළ මිළ ගණන්
- හදිසි හා වැදගත් දුරකථන අංක
- උදා: 1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය
  119 හදිසි ඇමතුම් අංශය
- වෙළෙඳ දැන්වීම්
- ලුහුඬු දැන්වීම්
- රාජ්‍ය නිවේදන
- රැකියා තොරතුරු

# විවිධ අවස්ථා හා සංසිද්ධිවලට මුහුණ දීම

**අපගේ ජීවන ගමනේදී අප මුහුණ දෙන විවිධ අවස්ථා හා සංසිද්ධිවලට මුහුණ දෙන අවස්ථා**

- ❖ විභාගවලට මුහුණ දීම, විභාග අසමත්වීම
- ❖ අපගේ සමීපතම පවුලේ සාමාජිකයින් මියයාම
- ❖ මුදල් අග හිගකම් ඇතිවීම
- ❖ යහළුවන් තරහවීම
- ❖ නොගැලපෙන මිතුරන් ඇසුරු කිරීම
- ❖ රැකියා සදහා තීරණ ගැනීම
- ❖ විෂය තෝරා ගැනීම
- ❖ හැකියා හා දක්ෂතා නිවැරදිව හදුනා ගැනීම
- ❖ සමාජ අසාධාරණවලට ලක්වීම
- ❖ මානසික අසහනය
- ❖ හදිසි ආපදාවන්ට ලක්වීම

# අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට ඇති විකල්ප

- විභාගයට නැවත සූදානම් වීම
- වෘත්තීය පාඨමාලාවක් හැදෑරීම
- තම හැකියා දක්ෂතා ඇති අංශයන් දියුණු කර ගැනීම
- ස්වයං රැකියාවක් කිරීම
- පුහුණුවකට යොමු වීම

# *YOU CAN IF YOU THINK YOU CAN*

# *තරඹන්න*




# ජීවිත අභියෝග අවස්ථාවල දී නිර්මාණශීලීව කටයුතු කිරීම

## නිර්මාණශීලීභාවය පුද්ගලයා සතු සුවිශේෂම ශක්තියයි



### මෙම ගුණාංග ඔබ සතු නම් ඔබ නිර්මාණශීලියි


මගේ අනාගතය සුභවාදීද?
පවත්නා තත්ත්වය පිළිබඳ සෑහීමකට පත් වනවාද?
දැඩි කුතුහලයකින් යුක්තද?
නිරීක්ෂණශීලීද?
විකල්ප සලකා බලන්නේවාද?
අනාගතය ගැන දවල් සිහින බලනවාද?
සෑම විටම උනන්දුද?
තරක පුරුදු හඳුනාගත හැකිද?
නිදහස්ව සිතනවාද?
ප්‍රායෝගික ප්‍රශ්න සඳහා නව විසඳුම් ලබා දෙනවාද?

# ජන සමාජයේ පවතින අයිතිවාසිකම්

ජන සමාජය මඟින් පුද්ගලයාට තැබී තම තමන්ට ලැබී

ඇති වරප්‍රසාදයන් අයිතිවාසිකම් ය


සමාජය තුළින්ම
හිමි වේ
ආත්මාර්ථකාමීත්ව
යෙන් තොර වෙයි
යුතුකම සමග
බැදෙයි
අයිතිවාසිකම්වල
ලක්ෂණ
අසීමිත නොවී පවතී
සමාජයේ පොදු යහපත
සමග එකට බැදේ

# තමන්ට හිමි අයිතිවාසිකම්

| සිවිල් අයිතිවාසිකම් | දේශපාලන අයිතිවාසිකම් |
|---|---|
| ජීවත්වීමේ අයිතිය | ඡන්දය ප්‍රකාශ කිරීම |
| අධ්‍යාපනය ලැබීමේ අයිතිය | ඡන්දය ලබා ගැනීම |
| කැමති ආගමක් ඇදහීම | දේශපාලන පක්ෂයට බැදීම |
| අදහස් ප්‍රකාශ කිරීම | කැමති ආණ්ඩුවක් පත් කර ගැනීම |
| රැකියාවක් කිරීම | ආණ්ඩුව විවේචනය කිරීම |
| සමානාත්මතාව | රජයේ තනතුරු දැරීම |
| කැමති තැනක ජීවත් වීම | |

# අයිතිවාසිකම් හා බැඳුනු යුතුකම්

පොදු සමාජයේ පැවැත්ම සඳහා පුරවැසියන් තම තමන්ට පැවරෙන කාර්යයන් ඉටු කිරීමට ඇති බැඳීම යුතුකම් නම් වේ.

## අයිතිවාසිකම්

- අධ්‍යාපනය ලැබීම
- කැමති ආගමක් ඇදහීම
- අදහස් ප්‍රකාශ කිරීම
- ජීවත්වීම

## යුතුකම්

- හොඳින් ඉගෙනීම
- වෙනත් ආගමික කොටස්වලට හිරිහැර නොකිරීම
- අන් අයගේ සිත් රිදෙන ලෙස කතා නොකිරීම
- අන් අයට කරදරයක් නොවන ලෙස

# නීතිමය රාමුවක් තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමේ වැදගත්කම

***නීතිමය රාමුවක් තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමෙන් යහපත් සමාජයක් නිර්මාණය වේ.***

***එමගින්,***

- ✓ *සෑම පුද්ගලයෙකුගේම පෞද්ගලික අයිතිය හා නිදහස ආරක්ෂා වීම*
- ✓ *ජනතා අවශ්‍යතා ඉටුවීම*
- ✓ *යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා වර්ධනය වීම*
- ✓ *යහපත් ජීවන ක්‍රමයක් ගොඩනගා ගත හැකිවීම*
- ✓ *ශිෂ්ට සම්පන්න සමාජයක් බිහිවීම*

# ජන සමාජයේ යහපත් පුරවැසියෙකු වශයෙන් ජීවත් වීම සදහා ප්‍රගුණ කළ යුතු ගුණාංග

- නීතිගරුක බව
- යුතුකම් ඉටු කිරීම
- චාම් දිවි පැවැත්ම
- අන්මත ඉවසීම
- අයිතිවාසිකම් වලට ගරු කිරීම
- විනයගරුක බව
- ප්‍රියවචන භාවිතය
- පරාර්ථකාමී බව
- සදාචාරාත්මකබව
- අවංකබව
- දයාව, කරුණාව
- අන් අයට ආදරය කිරීම

# වෘත්තිකයින්ගේ අයිතිවාසිකම්

මානව අයිතිවාසිකම් පිළිබඳ
විශ්ව ප්‍රකාශනයෙහි 23 වගන්තිය
මගින් පුද්ගලයන්ට ලැබෙන හිමිකම

- රැකියාව නිදහසේ තෝරා ගැනීමටත්
- වැඩ කිරීමේදී සාධාරණව පහසුකම් ලබා ගැනීමටත්
- රැකියාවේ සුරක්ෂිත බව ලැබීමටත්

# රාජ්‍ය හා පුද්ගලික අංශයේ සේවයේ නියුතු වෘත්තිකයින්ගේ අයිතිවාසිකම් සුරැකීමට ඇති නීති රීති

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සේවකයින් ආරක්ෂා කිරීමට හා අයිතිවාසිකම් සුරැකීමට නීතියෙන් බැදී ඇත.

- කම්කරු නීති, සේවක අර්ථ සාධක අරමුදල, වැන්දඹු අනත්දරු හා විශ්‍රාම වැටුප්, රක්ෂණ ක්‍රම, මානව හිමිකම් කොමිසම, ආයතන සංග්‍රහය ආදී වශයෙන්

වෘත්තිකයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට විධි විධාන යොදා ඇත.

# සේවක නීති නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා ඇති විය හැකි අවාසි

- ශ්‍රමය සූරාකෑම
- සේවක අතෘප්තිය
- සාධාරණ වැටුපක් නොලැබීම
- වෘත්තීය සුරක්ෂිතතාව නැතිවී යාම
- විශ්‍රාම ගිය විට අසරණ තත්ත්වයට පත්වීම
- සේවක අසාධාරණකම් සිදුවීම
- සේවා යෝජකයින්ගේ බලපෑමට ලක්වීම
- අනාරක්ෂිතව කටයුතු කිරීමෙන් රෝගීවීම, අනතුරුවලට ලක්වීම

# ළමා ශ්‍රමය සූරාකෑම වැළැක්වීම

- ✓ ළමා ශ්‍රමය සූරාකෑම වැළැක්වීමට ඇති පනත - සාප්පු හා කාර්යාල පනත
- ✓ ඊට අනුව වයස අවුරුදු 14ට අඩු දරුවන් සේවයෙහි යෙදවීමට නොහැක
- ✓ ඒවා වැළැක්වීමට කම්කරු කොමසාරිස්ගේ සහය ලබා ගත හැක

# දරුවන් රැකියාවල යෙදීමට හේතු

- පවුල්වල ආර්ථික ගැටලු
- පිළිසරණක් නොමැති දරුවන්
- දෙමාපියන්ගේ නොදැනුවත්බව
- ඇතැම් පුද්ගලයින්ගේ බලපෑම්
- පාරම්පරික රැකියා

# ළමා ශ්‍රමිකයින් සේවයේ යෙදවීමෙන් ඇති විය හැකි බලපෑම්

- කායික හා මානසික ශක්තිය පිරිහීමෙන් රෝගීවීම
- ශ්‍රමය සූරා කෑමට ලක්වීම
- අපයෝජනයට ලක්වීම
- ඉගෙනීමට ඇති අවස්ථා අහිමි වීම
- සුන්දර වූ ළමා කාලය අහිමි වීම
- සමාජ විරෝධී ක්‍රියාවලට යොමුවීම
- මත්පැන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම
- වධ හිංසාවලට ලක්වීම
- ආබාධිත තත්ත්වයන්ට ගොදුරුවීම

# ළමා ශ්‍රමිකයින් හා සම්බන්ධ සමාජ වගකීම

- සියලුම දරුවන් අපේම දරුවන් ලෙස සැලකීම
- අනිවාර්ය අධ්‍යාපනය සදහා පාසලකට යොමු කිරීම
- පටු ලාභ අපේක්ෂාවෙන් දරුවන් සේවයට නොගැනීම
- ළමා ශ්‍රමිකයින් පිළිබද අදාල ආයතන දැනුවත් කිරීම
- වැඩිහිටි දරුවන්ගෙන් යැපීමට යොමු නොවීම

# සේවකයින් විශ්‍රාමයාම

- රාජ්‍ය සේවකයින් සිය කැමැත්තෙන් විශ්‍රාම යන වයස

  **අවුරුදු *57***

- රාජ්‍ය සේවකයින් අනිවාර්ය විශ්‍රාම යන වයස

  **අවුරුදු *60***

- පෞද්ගලික අංශයේ සේවකයින්ට අර්ථසාධක අරමුදල ගත හැකි වයස

  **අවුරුදු *55***

- කාන්තාවන්ට විශ්‍රාමයාමට කලින් සිය අර්ථ සාධකය ලබා ගත හැකි අවස්ථාව වන්නේ

  ***විවාහය***

# විශ්‍රාම යාමට පෙර කළ යුතු කාර්යයන් ලෙස

- ✓ විශ්‍රාම යාමට මාස හයකට පෙර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතුය
- ✓ සිය පෞද්ගලික ලිපි ගොනුව සම්පූර්ණ කළ යුතුය

**දිවියේ විවේකීම අවධිය විශ්‍රාම අවධියයි**

# විශ්‍රාම කාලය ඵලදායීව ගත කළ හැක්කේ කෙසේද?

- ✓ විනෝදාංශවල යෙදීම
- ✓ පවුලේ කටයුතුවලට සහය දීම
- ✓ නිර්මාණකරණයට යොමු වීම
- ✓ තම අත්දැකීම් බෙදා හදාදීම



ඔබට හැකි සාක්ෂියට එකගව වැඩිපට

සරිලන සේවයක් සිදු කරන්න







# සමාජය මගින් සමාජ කණ්ඩායම් ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියා මාර්ග

**ළමයින් සඳහා**

- පාසල
- නොමිලේ අධ්‍යාපනය
- පෝෂණය රැකවරණය

**තරුණ තරුණියන් සඳහා**

- වෘත්තීය පාඨමාලා
- රැකියා ආයතන
- වෘත්තීය සමිති

**වයෝ වෘද්ධයින් සඳහා**

- විශ්‍රාම වැටුප්
- සුභ සාධක අරමුදල්
- සෞඛ්‍ය ආරක්ෂණය

# ළමයින් හා වැඩිහිටියන් ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවරවල්

| ළමයින් | වැඩිහිටියන් |
|---|---|
| * දරුවන් රැකබලා ගැනීමේ මධ්‍යස්ථාන | * විශ්‍රාම වැටුප් රක්ෂණ දීම |
| * අධ්‍යාපන පහසුකම් | * සෞඛ්‍ය රක්ෂණ ක්‍රම ලබා දීම |
| * නොමිලේ හෝ සහනදායි ගෙවීම් මත ලබා දීම | * වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථාන |
| * ශිෂ්‍යත්ව ලබා දීම | |
| * රැකියා ලැබෙන තුරු දීමනා දීම | |

# ජන සමාජයේ සාමාජිකයින් මුහුණ දෙන අභියෝග

**අභියෝගවලට මුහුණ දීමට දියුණු කර ගත යුතු ගුණාංග**

ඉවසීම
ස්ථිරසාරත්වය
උපක්‍රමිකබව
උපායශීලීවීම
ස්ථිර අධිෂ්ඨානය
නිර්භීතකම

නිර්මාණශීලීත්වය
නොපසුබටභාවය
කායික හා මානසික ශක්තිය
දරාගැනීමේ ශක්තිය
ආත්ම විශ්වාසය
විචාරශීලීත්වය

# වර්තමාන සමාජයේ සාමාජිකයින් මුහුණදෙන අභියෝග

- තරගකාරීත්වයට මුහුණදීම
- සමාජය සංකීර්ණවීම
- මාධ්‍ය බලපෑම
- නූතන විලාසිතා
- සංස්කෘතික පරිහානිය
- සාරධර්ම පිරිහීම
- අපචාර බහුලවීම
- අහිතකර බලවේගවලින් දරුවන් බේරා ගැනීම
- විරැකියාව
- අධ්‍යාපනය හා වැඩ ලෝකය නොගැලපීම
- ඉංග්‍රීසි බස හැසිරවීමේ දුර්වලතා
- නව තාක්ෂණික උපාංග භාවිතය
- ඉහළ යන ජීවන වියදම
- පාරිසරික ගැටලු

# අභියෝග සාර්ථක කරගැනීමට ගත යුතු ක්‍රියා මාර්ග

- පූර්ව සූදානම
- නිශ්චිත වැඩ පිළිවෙලක් අනුගමනය කිරීම
- අභියෝගවලින් පලා යනවා වෙනුවට ඊට මුහුණදීම
- ජීවිත අරමුණු හෝ ඉලක්ක ගොඩනගා ගැනීම
- දැරිය හැකි ජීවන රටාවක් ගොඩනගා ගැනීමට යොමුවීම
- නිවැරදි තීරණ ගැනීම
- නිර්මාණශීලී චින්තනය
- සමාජයේ හිතකර බලවේග ළගා කර ගැනීම
- සැලසුමක් අනුව කටයුතු සංවිධානය
- විවිධ විකල්ප තෝරා බේරා ගැනීම
- වැඩිහිටි උපදෙස් හා මග පෙන්වීම් ලබා ගැනීම
- සියලු පරාජයන් ජීවිත අත්දැකීම් බවට පත් කර ගැනීම
- අසුබවාදී දෘෂ්ඨියෙන් තොරවීම
- තමා කරන කටයුතු පිලිබද විශ්වාසවන්තභාවය

# ජන සමාජයේ යහපත උදෙසා තම යුතුකම් හා වගකීම්


යුතුකම් යනු පොදු සමාජ පැවැත්ම සඳහා පුරවැසියන් විසින් තම තමන්ට පැවරෙන කාර්යයන් ඉටු කිරීමට ඇති බැඳීමයි

# යුතුකම්

| නීතිමය යුතුකම් | සදාචාරාත්මක යුතුකම් |
|---|---|
| •රජයට අවනත වීම | •ජාතික සංකේත හා ජාතික වීරයන්ට ගරු කිරීම |
| •රාජ්‍ය නීති පිලිපැදීම | •වැඩිහිටියන්ට සැලකීම, ගරු කිරීම |
| •බදු ගෙවීම | •දෙමාපියන්ට සැලකීම |
| •රාජකාරිය නිසි ලෙස ඉටු කිරීම | •ආචාරශීලීවීම |
| •නීතිය හා සාමය පවත්වා ගෙන යාම | •සම්ප්‍රදායන් රැකීම |
| | •අන්‍ය ආගම්වලට හා ජාතීන්ට ගරු කිරීම |

සමාජයේ
යහපත සඳහා
නීතිමය යුතුකම්
පැහැර
නොහැර ඉටු කළ
යුතුයි

සදාචාරාත්මක
යුතුකම්
ඉටු කිරීම හෘද
සාක්ෂිය
අනුව ඉටු කළ
යුතු දෙයකි


නීතිමය යුතුකම් පැහැර හැරීමෙන් දඬුවම් ලැබිය හැකිය
සදාචාරාත්මක යුතුකම් පැහැර හැරීමෙන් පුද්ගල චර්යාව පිරිහීමට ලක්වේ

# වගකීම්

**යුතුකම් ඉටු කිරීමට ඇති බැඳීම වගකීම වේ**


***පුරවැසියන් ලෙස අපට ඇති වගකීම්***

- *ජන සමාජයේ පුද්ගලයින්ගේ යහපත සදහා ඇති පොදු දේපළ පරිහරණය කරමින් ආරක්ෂා කිරීම*
- *සමාජයේ පවතින් නීතිරීතිවලට ගරු කිරීම*
- *ජන සමාජයේ යහපාලනයට දායකවීම*


යුතුකම් හා වගකීම් ගසට පොත්ත
මෙනි.වෙන් කල නොහැක.

# යුතුකම් හා වගකීම් ඉටු කිරීම සමාජ යහපතට හේතුවන ආකාරය

නිදසුන්:



## සමාජය තුළ යුතුකම් හා වගකීම මැනවින් ඉටුවීම නිසා පුද්ගල සම්බන්ධතා වැඩි වේ.

- යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පහසුවෙන් පවත්වා ගෙන යා හැකිය.
- සෑම කෙනෙකුටම යහපත්ව ජීවත්වීමට අවකාශ සැලසේ.



**සවියෙන් පෙරට අපි එකට**

***e*- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | පුරවැසි අධ්‍යාපනය | 2 | 02. අපේ ජන සමාජය - ඇගයීම |

**සැකසුම: ගයානි විජේමාන්න**
**බප/හො/ගල්පාත ක.වි**

1) ජන සමාජයක් යනු කුමක්ද?

1.1 ***ජන සමාජය තුළ ඇති අන්තර් සම්බන්ධතා***

1) සබඳතාවල පදනම ආරම්භ වන්නේ කුමක් මුල් කරගෙනද?
2) ජන සමාජයක අන්තර් සබඳතා පවතින අවස්ථා මොනවාද?
3) දෙමාපියන් දරුවන් කෙරෙහි යුතුකම් මගින් අන්තර් සම්බන්ධතා පවත්වන ආකාරයන් මොනවාද?
4) දරුවන් දෙමාපියන් කෙරෙහි යුතුකම් මගින් අන්තර් සම්බන්ධතා පවත්වන ආකාරයන් මොනවාද?
5) ගුරුවරුන් දරුවන් හා අන්තර් සම්බන්ධතා පවත්වා ගන්නා අවස්ථා මොනවාද?
6) අසල්වැසියන් හා පවත්වා ගත යුතු උතුම් මානුෂීය ගුණාංග මොනවාද?

1.2 ***සමාජයේ ඇති ආයතන සමග අන්තර් සම්බන්ධතා පැවැත්වීම***

1) ජන සමාජය හා අන්තර සම්බන්ධතා පවත්වන සංවිධාන මොනවාද?
2) ජන සමාජය තුළ පවත්නා විවිධ සම්බන්ධතා සඳහා ආගමික සංවිධාන දායක වන ආකාරය කුමක්ද?
3) ජන සමාජය තුළ පවත්නා විවිධ සම්බන්ධතා සඳහා ග්‍රාම සංවිධාන සහාය ලබාදෙන අයුරු ලියන්න
4) ජන සමාජය තුළ පවත්නා විවිධ සම්බන්ධතා සඳහා ක්‍රීඩා සංවිධාන දායක වන අයුරු ලියන්න

1.3 ***දත්ත හා තොරතුරු ජන සමාජයේ යහ පැවැත්ම පිණිස යොදා ගැනීම***

1) දත්ත යනු කුමක්ද?
2) තොරතුරු ලබා ගැනීමට ඇති ප්‍රවේශ මාර්ග මොනවාද?
3) දෛනිකව ඉදිරිපත් කෙරෙන අපට අත්‍යවශ්‍ය වන තොරතුරු මොනවාද?

1.4 *විවිධ සංසිද්ධීන්වලට සාර්ථකව මුහුණදීම*

1) අපගේ ජීවන ගමනේදී අප මුහුණ දෙන විවිධ අවස්ථා හා සංසිද්ධිවලට මුහුණ දෙන අවස්ථා මොනවාද?
2) අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට ඇති විකල්ප මොනවාද?
3) නිර්මාණශීලී පුද්ගලයකු සතු ලක්ෂණ මොනවාද?

1.5 *ජන සමාජයේ පවතින අයිතිවාසිකම්*

1) අයිතිවාසිකම් යනු කුමක්ද?
2) අයිතිවාසිකම්වල ලක්ෂණ මොනවාද?
3) තමන්ට හිමි සිවිල් අයිතිවාසිකම් මොනවාද?
4) තමන්ට හිමි දේශපාලන අයිතිවාසිකම් මොනවාද?

1.6 *අයිතිවාසිකම් හා බැඳුනු යුතුකම්*

1) යුතුකම් යනු කුමක්ද?
2) යුතුකම් සඳහා උදාහරණ කිහිපයක් දෙන්න

1.7 *නීතිමය රාමුවක් තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමේ වැදගත්කම*

1) නීතිමය රාමුවක් තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමේ වැදගත්කම කුමක්ද?

1.8 *ජන සමාජයේ යහපත් පුරවැසියෙකු වශයෙන් ජීවත් වීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග*

1) උතුම් මානව ගුණාංග මොනවාද?

1.9 *වෘත්තිකයින්ගේ අයිතිවාසිකම්*

1) මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි 23 වගන්තිය මගින් පුද්ගලයන්ට ලැබෙන වෘත්තීය හිමිකම් මොනවාද?
2) රාජ්‍ය හා පුද්ගලික අංශයේ සේවයේ නියුතු වෘත්තිකයින්ගේ අයිතිවාසිකම් සුරැකීමට ඇති නීති රීති මොනවාද?
3) සේවක නීති නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා ඇති විය හැකි අවාසි මොනවාද?

1.10 *ළමා ශ්‍රමය සූරාකෑම වැළැක්වීම*

1) ළමා ශ්‍රමය සූරාකෑම වැළැක්වීමට ඇති පනත කුමක්ද?
2) ඊට අනුව දරුවන් සේවයේ යෙදිය නොහැකි වයස් මට්ටම කුමක්ද?
3) ඒවා වැළැක්වීමට දැන්විය යුතු පුද්ගලයා කවුද?
4) දරුවන් රැකියාවල යෙදීමට හේතු මොනවාද?
5) ළමා ශ්‍රමිකයින් සේවයේ යෙදවීමෙන් ඇති විය හැකි බලපෑම් මොනවාද?
6) ළමා ශ්‍රමිකයින් හා සම්බන්ධ සමාජ වගකීම් මොනවාද?

1.11 ***සේවකයින් විශ්‍රාමයාම***

1) රාජ්‍ය සේවකයින් සිය කැමැත්තෙන් විශ්‍රාම යා හැකි වයස් සීමාව කොපමනද?
2) රාජ්‍ය සේවකයින් සිය අනිවාර්ය පරිදි විශ්‍රාම යන වයස කොප්මනද?
3) පෞද්ගලික අංශයේ සේවකයින් අර්ථසාධක අරමුදල ගත හැකි වයස ලියන්න
4) කාන්තාවන්ට විශ්‍රාමයාමට කළින් සිය අර්ථ සාධකය ලබා ගත හැකි අවස්ථාව කුමක්ද?
5) විශ්‍රාම යාමට පෙර කළ යුතු කාර්යයන් මොනවාද?
6) විශ්‍රාම කාලය ඵලදායීව ගත කළ හැක්කේ කෙසේද?

1.12 ***සමාජය මගින් ළමයින්, තරුණයින්, වයෝවෘද්ධ අය ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියා මාර්ග***

1) සමාජය මගින් ළමයින්, තරුණයින්, වයෝවෘද්ධ අය ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද?
2) ළමයින් හා වැඩිහිටියන් ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවරවල් මොනවාද?

1.13 ***ජන සමාජයේ සාමාජිකයින් මුහුණ දෙන අභියෝග***

1) අභියෝගවලට මුහුණ දීමට දියුණු කර ගත යුතු ගුණාංග මොනවාද?
2) වර්තමාන සමාජයේ සාමාජිකයින් මුහුණදෙන අභියෝග මොනවාද?
3) අභියෝග සාර්ථක කරගැනීමට ගත යුතු ක්‍රියා මාර්ග මොනවාද?

1.14 ***ජන සමාජයේ යහපත උදෙසා තම යුතුකම් හා වගකීම්***

1) යුතුකම් යනු කුමක්ද?
2) යුතුකම් වර්ග කළ හැක්කේ කෙසේද?
3) නීතිමය යුතුකම් මොනවාද?
4) සදාචාරාත්මක යුතුකම් මොනවාද?
5) නීතිමය යුතුකම් හා සදාචාරාත්මක යුතුකම් අතර වෙනස ලියන්න

1.15 ***වගකීම්***

1) වගකීම් යනු කුමක්ද?
2) පුරවැසියන් ලෙස අපට ඇති වගකීම් මොනවාද?
3) යුතුකම් හා වගකීම් ඉටු කිරීම සමාජ යහපතට හේතුවන ආකාරය ලියන්න
4) සමාජය තුළ යුතුකම් හා වගකීම මැනවින් ඉටුවීම නිසා සිදු වන්නේ කුමක්ද?

**සවියෙන් පෙරට අපි එකට**

***e*- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | පුරවැසි අධ්‍යාපනය | 2 | 02. අපේ ජන සමාජය - පිළිතුරු |

**සැකසුම: ගයානි විජේමාන්න**

**බප/හො/ගල්පාත ක.වි**

1) ජන සමාජයක් යනු මිනිසා මුල්කරගත්, මිනිසා විසින් නිර්මාණය කර ගත්තකි

1.1

1) පවුල මුල් කරගෙනය
2) දෙමාපිය දූ දරු අන්තර් සබදතා, ගුරුවරුන් සහ සිසුන් අතර අන්තර් සම්බන්ධතා, අසල්වැසියන් හා අන්තර සම්බන්ධතා
3)
   - දරුවන් හා පෝෂණය
   - ආරක්ෂා කිරීම
   - අධ්‍යාපනය ලබා දීම
   - අනෙකුත් අවශ්‍යතා සදහා සහය වීම
   - ලෙඩ රෝගවලින් ආරක්ෂා කිරීම
   - සුදුසු කල්හී අවාහ විවාහ කර දීම
4)
   - වියපත් වූ විට රැක ගැනීම
   - පෝෂණය කිරීම
   - ආදරය කිරීම
   - අවනත වීම
5)
   - දරුවා මැනවින් හික්මවීම
   - දරුවාගේ හැකියා, දක්ෂතා, විභවතා මැනවින් හදුනා අවශ්‍ය මග පෙන්වීම් කිරීම
   - අධ්‍යාපනය ලබා දීම
   - යහගුණ කියා දීම
   - වැරදි නිවැරදි පෙන්වමින් සමබර පෞරුෂයක් ගොඩ නැගීම

6)

- සමගිය
- සහෝදරත්වය
- සහයෝගය
- උදවු කිරීම
- බෙදා හදා ගැනීම

1.2

1)

- මරණාධාර සමිති
- යෞවන සමිති
- ක්‍රීඩා සමිති
- ග්‍රාම සංවර්ධන
- ආගමික සංවිධාන
- මහිලා සමිති
- වෘත්තීය සමිති

2)

- අධ්‍යාත්මික සංවර්ධනයට
- සාරධර්ම හුරු කිරීමට
- ආගමික වතාවත්වලට
- පොදු කටයුතුවලට
- සමාජය විනයවත් කිරීමට
- ආගම ඉගෙනීමට

3)

- සහයෝගයෙන් කටයුතු කිරීමට
- ගමට නායකත්වය සැපයීමට
- ප්‍රදේශයේ ආරක්ෂාවට
- සුභ සාධන කටයුතුවලට
- පොදු සේවා සැපයීමට
- ග්‍රාමය සංවර්ධනයට

4)

- විනය හා ශික්ෂණයට
- ක්‍රීඩා කටයුතු දියුණුවට
- ජය පරාජය හුරු කරවීමට
- නායකයින් තැනීමට
- සහයෝගයෙන් කටයුතු කිරීමට

- සංවිධාන ශක්තිය දියුණුවට

1.3

1) දත්ත යනු කිසියම් විෂය ක්ෂේත්‍රයක් හා සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කරන මූලාශ්‍රයි

2) රූපවාහිනී , පුවත්පත්, පොත්, ගුවන්විදුලිය, පරිගණක, අන්තර්ජාලය, දුරකථනය

3) දෛනිකව ඉදිරිපත් කෙරෙන අපට අත්‍යවශ්‍ය වන තොරතුරු

- කාලගුණ අනාවැකි
- විනිමය අනුපාත
- වෙළඳ පොළ මිළ ගණන්
- හදිසි හා වැදගත් දුරකථන අංක
- උදා: 1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය
- 119 හදිසි ඇමතුම් අංශය
- වෙළෙඳ දැන්වීම්
- ලුහුඩු දැන්වීම්
- රාජ්‍ය නිවේදන
- රැකියා තොරතුරු

1.4

1)

- විභාගවලට මුහුණ දීම, විභාග අසමත්වීම
- අපගේ සමීපතම පවුලේ සාමාජිකයින් මියයාම
- මුදල් අග හිඟකම් ඇතිවීම
- යහළුවන් තරහවීම
- නොගැලපෙන මිතුරන් ඇසුරු කිරීම
- රැකියා සඳහා තීරණ ගැනීම
- විෂය තෝරා ගැනීම
- හැකියා හා දක්ෂතා නිවැරදිව හඳුනා ගැනීම
- සමාජ අසාධාරණවලට ලක්වීම
- මානසික අසහනය
- හදිසි ආපදාවන්ට ලක්වීම

2)

- විභාගයට නැවත සූදානම් වීම
- වෘත්තීය පාඨමාලාවක් හැදෑරීම
- තම හැකියා දක්ෂතා ඇති අංශයන් දියුණු කර ගැනීම
- ස්වයං රැකියාවක් කිරීම

- පුහුණුවකට යොමු වීම

3)

- මගේ අනාගතය සුභවාදීද?
- පවත්නා තත්ත්වය පිළිබද සෑහීමකට පත් වනවාද?
- දැඩි කුතුහලයකින් යුක්තද?
- නිරීක්ෂණශීලීද?
- විකල්ප සලකා බලන්වාද?
- අනාගතය ගැන දවල් සිහින බලනවාද?
- සෑම විටම උනන්දුද?
- නරක පුරුදු හදුනාගත හැකිද?
- නිදහස්ව සිතනවාද?
- ප්‍රායෝගික ප්‍රශ්න සදහා නව විසදුම් ලබා දෙනවාද?

1.5

1) ජන සමාජය මගින් පුද්ගලයාට නැති නම් තමන්ට ලැබී ඇති වරප්‍රසාදයන් අයිතිවාසිකම් ය
2)

- සමාජය තුළින්ම හිමි වේ
- සමාජයේ පොදු යහපත සමග එකට බැදේ
- අසීමිත නොවී පවති
- ආත්මාර්ථකාමීත්වයෙන් තොර වෙයි
- යුතුකම් සමග බැදෙයි

3) සිවිල් අයිතිවාසිකම්

- ජීවත්වීමේ අයිතිය
- අධ්‍යාපනය ලැබීමේ අයිතිය
- කැමති ආගමක් ඇදහීම
- අදහස් ප්‍රකාශ කිරීම
- රැකියාවක් කිරීම
- සමානාත්මතාව
- කැමති තැනක ජීවත් වීම

4) දේශපාලන අයිතිවාසිකම්

- ඡන්දය ප්‍රකාශ කිරීම
- ඡන්දය ලබා ගැනීම
- දේශපාලන පක්ෂයට බැදීම
- කැමති ආණ්ඩුවක් පත් කර ගැනීම
- ආණ්ඩුව විවේචනය කිරීම

- රජයේ තනතුරු දැරීම

1.6

1) පොදු සමාජයේ පැවැත්ම සඳහා පුරවැසියන් තම තමන්ට පැවරෙන කාර්යයන් ඉටු කිරීමට ඇති බැඳීම යුතුකම් නම් වේ

2)

- හොඳින් ඉගෙනීම
- වෙනත් ආගමික කොටස්වලට හිරිහැර නොකිරීම
- අන් අයගේ සිත් රිදෙන ලෙස කතා නොකිරීම
- අන් අයට කරදරයක් නොවන ලෙස ජීවත් වීම ආදිය

1.7

1)

- මින් යහපත් සමාජයක් නිර්මාණය වේ
- සෑම පුද්ගලයෙකුගේම පෞද්ගලික අයිතිය හා නිදහස ආරක්ෂා වීම
- ජනතා අවශ්‍යතා ඉටුවීම
- යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතාවර්ධනය වීම
- යහපත් ජීවන ක්‍රමයක් ගොඩනගා ගත හැකිවීම
- ශිෂ්ට සම්පන්න සමාජයක් බිහිවීම

1.8

1)

- යුතුකම් ඉටු කිරීම
- නීතිගරුක බව
- චාම් දිවි පැවැත්ම
- අන්මත ඉවසීම
- අන් අයට ආදරය කිරීම
- දයාව, කරුණාව
- අවංකබව
- සදාචාරාත්මකබව
- පරාර්ථකාමී බව
- ප්‍රියවචන භාවිතය
- විනයගරුක බව
- අයිතිවාසිකම්වලට ගරු කිරීම

1.9

1)

- රැකියාව නිදහසේ තොරා ගැනීමටත්
- වැඩ කිරීමේදී සාධාරණව පහසුකම් ලබා ගැනීමටත්
- රැකියාවේ සුරක්ෂිත බව ලැබීමටත්

2)

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සේවකයින් ආරක්ෂා කිරීමට හා අයිතිවාසිකම් සුරැකීමට නීතියෙන් බැදී ඇත
- කම්කරු නීති, සේවක අර්ථ සාධක අරමුදල, වැන්දඹු අනත්දරු හා විශ්‍රාම වැටුප්, රක්ෂණ ක්‍රම, මානව හිමිකම් කොමිසම, ආයතන සංග්‍රහය ආදී වශයෙන් වෘත්තිකයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට විධි විධාන යොදා ඇත

3)

- ශ්‍රමය සූරාකෑම
- සේවක අතෘප්තිය
- සාධාරන වැටුපක් නොලැබීම
- වෘත්තීය සුරක්ෂිතතාව නැතිවී යාම
- විශ්‍රාම ගිය විට අසරණ තත්ත්වයට පත්වීම
- සේවක අසාධාරණකම් සිදුවීම
- සේවා යෝජකයින්ගේ බලපෑමට ලක්වීම
- අනාරක්ෂිතව කටයුතු කිරීමෙන් රෝගීවීම, අනතුරුවලට ලක්වීම

**1.10**

1) සාප්පු හා කාර්යාල පනත
2) අවුරුදු 14ට අඩු දරුවන් සේවයෙහි යෙදවීමට නොහැක
3) කම්කරු කොමසාරිස්ගේ සහය ලබා ගත හැක
4)
   - පවුල්වල ආර්ථික ගැටලු
   - පිළිසරණක් නොමැති දරුවන්
   - දෙමාපියන්ගේ නොදැනුවත්බව
   - ඇතැම් පුද්ගලයින්ගේ බලපෑම්
   - පාරම්පරික රැකියා

5)

- කායික හා මානසික ශක්තිය පිරිහීමෙන් රෝගීවීම
- ශ්‍රමය සූරා කෑමට ලක්වීම
- අපයෝජනයට ලක්වීම
- ඉගෙනීමට ඇති අවස්ථා අහිමිවීම
- සුන්දර වූ ළමා කාලය අහිමිවීම
- සමාජ විරෝධී ක්‍රියාවලට යොමුවීම
- මත්පැන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම
- වද හිංසාවලට ලක්වීම
- ආබාධිත තත්ත්වයන්ට ගොදුරුවීම

6)

- සියලුම දරුවන් අපේම දරුවන් ලෙස සැලකීම
- අනිවාර්ය අධ්‍යාපනය සඳහා පාසලකට යොමු කිරීම
- පටු ලාභ අපේක්ෂාවෙන් දරුවන් සේවයට නොගැනීම
- ළමා ශ්‍රමිකයින් පිළිබඳ අදාල ආයතන දැනුවත් කිරීම
- වැඩිහිටියන් දරුවන්ගෙන් යැපීමට යොමු නොවීම

1.11

1) අවුරුදු 57
2) අවුරුදු 60
3) අවුරුදු 55
4) විවාහය
5)
    - විශ්‍රාම යාමට මාස හයකට පෙර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතුය
    - සිය පෞද්ගලික ලිපි ගොනුව සම්පූර්ණ කළ යුතුය
6)
    - විනෝදාංශවල යෙදීම
    - පවුලේ කටයුතුවලට සහය දීම
    - නිර්මාණකරණයට යොමු වීම
    - තම අත්දැකීම් බෙදා හදාදීම

1.12

1)

- ළමයින් සදහා - පාසල, නොමිලේ අධ්‍යාපනය, පෝෂණය රැකවරණය
- තරුණ තරුණියන් සදහා - වෘත්තිය පාඨමාලා, රැකියා ආයතන,වෘත්තීය ආයතන
- වයෝවෘද්ධයින් සදහා - විශ්‍රාම වැටුප්, සුභ සාධක අරමුදල් ,සෞඛ්‍ය ආරක්ෂණය

**2)** **<u>ළමයින්ට</u>**

- දරුවන් රැකබලා ගැනීමේ මධ්‍යස්ථාන
- අධ්‍යාපන පහසුකම්
- නොමිලේ හෝ සහනදායි ගෙවීම් මත ලබා දීම
- ශිෂ්‍යත්ව ලබා දීම
- රැකියා ලැබෙන තුරු දීමනා දීම

**<u>වැඩිහිටියන්ට</u>**

- විශ්‍රාම වැටුප් රක්ෂණ දීම
- සෞඛ්‍ය රක්ෂණ ක්‍රම ලබා දීම
- වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථාන

1.13

1)

- ඉවසීම
- දරාගැනීමේ ශක්තිය
- ස්ථිර අධිෂ්ඨානය
- ආත්ම විශ්වාසය
- නිර්භීතකම
- විචාරශීලීත්වය
- නිර්මාණශීලීත්වය
- නොපසුබටභාවය
- ස්ථිරසාරත්වය
- කායික හා මානසික ශක්තිය
- උපායශීලීවීම
- උපක්‍රමිකබව

2)

- තරගකාරීත්වයට මුහුණදීම
- සමාජය සංකීර්ණවීම
- මාධ්‍ය බලපෑම
- නූතන විලාසිතා
- සංස්කෘතික පරිහානිය
- සාරධර්ම පිරිහීම
- අපචාර බහුලවීම
- අහිතකර බලවේගවලින් දරුවන් බේරා ගැනීම
- විරැකියාව
- අධ්‍යාපනය හා වැඩ ලෝකය නොගැලපීම
- ඉංග්‍රීසි බස හැසිරවීමේ දුර්වලතා
- නව තාක්ෂණික උපාංග භාවිතය
- ඉහළ යන ජීවන වියදම
- පාරිසරික ගැටලු

3)

- පූර්ව සූදානම
- නිශ්චිත වැඩ පිළිවෙලක් අනුගමනය කිරීම
- අභියෝගවලින් පලා යනවා වෙනුවට ඊට මුහුණදීම
- ජීවිත අරමුණු හෝ ඉලක්ක ගොඩනගා ගැනීම
- දැරිය හැකි ජීවන රටාවක් ගොඩනගා ගැනීමට යොමුවීම
- නිවැරදි තීරණ ගැනීම
- නිර්මාණශීලී චින්තනය
- සමාජයේ හිතකර බලවේග ළගා කර ගැනීම
- සැලසුමක් අනුව කටයුතු සංවිධානය
- විවිධ විකල්ප තෝරා බේරා ගැනීම
- වැඩිහිටි උපදෙස් හා මග පෙන්වීම් ලබා ගැනීම
- සියලු පරාජයන් ජීවිත අත්දැකීම් බවට පත් කර ගැනීම
- අසුබවාදී දෘෂ්ටියෙන් තොරවීම
- තමා කරන කටයුතු පිලිබද විශ්වාසවන්තභාවය

1.14

1) පොදු සමාජ පැවැත්ම සදහා පුරවැසියන් විසින් තම තමන්ට පැවරෙන කාර්යයන් ඉටු කිරීමට ඇති බැදීමයි
2) නීතිමය යුතුකම්, සදාචාරාත්මක යුතුකම්

3)

- රජයට අවනත වීම
- රාජ්‍ය නීති පිලිපැදීම
- බදු ගෙවීම
- රාජකාරිය නිසි ලෙස ඉටු කිරීම
- නීතිය හා සාමය පවත්වා ගෙන යාම

4)

- දෙමාපියන්ට සැලකීම
- වැඩිහිටියන්ට සැලකීම, ගරු කිරීම
- ආචාරශීලීවීම
- සම්ප්‍රදායන් රැකීම
- අන්‍ය ආගම්වලට හා ජාතීන්ට ගරු කිරීම
- ජාතික සංකේත හා ජාතික වීරයන්ට ගරු කිරීම

5)

| නීතිමය යුතුකම් | සදාචාරාත්මක යුතුකම් |
|---|---|
| 1) සමාජයේ යහපත සඳහා නීතිමය යුතුකම් පැහැර නොහැර ඉටු කළ යුතුයි | සදාචාරාත්මක යුතුකම් ඉටු කිරීම හෘද සාක්ෂිය අනුව ඉටු කළ යුතු දෙයකි |
| 2) නීතිමය යුතුකම් පැහැර හැරීමෙන් දඩුවම් ලැබිහ හැකිය | සදාචාරාත්මක යුතුකම් පැහැර හැරීමෙන් පුද්ගල චර්යාව පිරිහීමට ලක්වේ |

1.15

1) යුතුකම් ඉටු කිරීමට ඇති බැඳීම වගකීම වේ
2)

- ජන සමාජයේ පුද්ගලයින්ගේ යහපත සඳහා ඇති පොදු දේපළ පරිහරණය කරමින් ආරක්ෂා කිරීම
- සමාජයේ පවතින නීතිරීතිවලට ගරු කිරීම
- ජන සමාජයේ යහපාලනයට දායකවීම

3)

- නීතිරීති පිළිපැදීම
- නීතිරීතිවලට ගරු කරන පුරවැසියන් බිහිවීම
- වැරදි කිරීමට පුද්ගලයින් නොපෙළඹීම
- නීතිගරුක පුරවැසියන් බිහිවීම
- තමන්ගේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වීම

4)

- පුද්ගල සම්බන්ධතා වැඩි වේ.
- යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පහසුවෙන් පවත්වා ගෙන යා හැකිය.
- සෑම කෙනෙකුටම යහපත්ව ජීවත්වීමට අවකාශ සැලසේ.